# විසිවන සියවසේ ආසියාතික රටවල නැඟීම

3

මෙහි දී අපි ඉන්දියාව, ජපානය සහ චීනය යන රටවල් 20 වන සියවසේ මුල් භාගය තුළ නැඟී සිටි ආකාරය පිළිබඳව සාකච්ඡා කරමු.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත්ව සිටි ඉන්දියාව එයට එරෙහිව නැඟී සිට එම ග්‍රහණයෙන් මිදී නිදහස ලබා ගත් අතර කිසියම් අධිරාජ්‍යයකට සෘජු ලෙස යටත් ව නොපැවති ජපානය සහ චීනය ද ඔවුන් වෙත එල්ල වී තිබූ විවිධාකාර වූ අධිරාජ්‍යවාදී බලපෑම්වලින් මිදී ස්වෛරී ස්වාධීන රාජ්‍යයන් ලෙස නැඟී සිටියහ. ආසියාතික රටවල් ලෙස මෙම රාජ්‍යයන්ගේ නැඟී සිටීම කුඩා ආසියාතික රාජ්‍යයක් වූ ශ්‍රී ලංකාවට ද මහඟු ආදර්ශයකි.




රූපය 3.1
වස්කෝ ද ගාමා මහතා

## ඉන්දියාව

වස්කෝ ද ගාමා නමැති පෘතුගීසි නාවිකයා ක්‍රි.ව. 1498 දී ඉන්දියාවේ කැලිකට් නගරයට සම්ප්‍රාප්ත වීමෙන් පසුව බටහිර ජාතීන්ට ඉන්දියාවේ දොරටු විවෘත විය. මුල දී බටහිර ජාතීන් ඉන්දියාවට පැමිණියේ වෙළෙඳුන් වශයෙනි. එසේ වුව ද ටික කලක් ගත වන විට දේශපාලන කටයුතුවලට ද යුරෝපා ජාතීහු මැදිහත් වූහ. පෘතුගීසි, ලන්දේසි හා ප්‍රංශ යන ජාතීන් ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවල බලය ව්‍යාප්ත කළ අතර ක්‍රි : ව. 1848 පමණ වන විට මුළු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක බලය පිහිටුවා ගැනීමට බ්‍රිතාන්‍යයෝ සමත් වූහ.

ඉන්දියාව මුළුමනින් ම පාහේ බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් පසුව වෙළෙඳ සමාගමේ පාලනයට එරෙහිව වරින්වර කැරැලි ඇති විය. ක්‍රි : ව. 1806, 1844, 1849, 1850, 1852 යන වර්ෂවල ඇති වූ කැරැලි මර්දනය කරන ලදී. ක්‍රි.ව. 1857 වර්ෂයේ ඇති වූ සිපෝයි හමුදා කැරැල්ල බ්‍රිතාන්‍යයන්ට එරෙහිව පැන නැගුණු බිහිසුණු ම කැරැල්ල විය.

ක්‍රි.ව. 1857 කැරැල්ලට හේතු වූ සාධක දේශපාලන, ආර්ථික, ආගමික, සමාජයීය හා යුද්ධමය වශයෙන් බෙදා දැක්විය හැකි ය. ඉන් කිහිපයක් පහත දැක්වේ.



රූපය 3.2
බෙංගාලයේ සිපෝයි හටයෝ

- ඉංග්‍රීසීන් ඉන්දියාවේ ප්‍රදේශ ඈඳා ගැනීමේ දී අනුගමනය කළ අත්තනෝමතික ප්‍රතිපත්තිය
- ඉන්දියානු නායකයන් නිගරුවට පත් කිරීම
- දුම්රිය, විදුලි පණිවිඩ හා තැපැල් සේවා ආරම්භ කිරීම මගින් ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලට ආවේණිකව පැවති හුදකලා බව නැති කිරීම සහ එමගින් ඒවා බටහිර ආභාෂයට විවෘත කිරීම
- බ්‍රිතාන්‍ය පාලකයන් ක්‍රිස්තියානි මිෂනාරීන්ට උදව් දීම
- ඉන්දියාවේ සම්පත් බ්‍රිතාන්‍යයට ගෙන යාම
- ඉන්දියාවේ අවශ්‍යතා නොසලකා හැරීම
- ඇෆ්ගනිස්ථානය වැනි බ්‍රිතාන්‍යයින්ගේ වෙනත් යටත් ප්‍රදේශවල ඇති වූ යුද්ධ.
- ආසන්නම හේතුව වූයේ හමුදා භටයන්ට භාවිතයට ලබා දුන් මේද තවරන ලද පතරොම් ය. ඒවායේ දවටනය කටින් කඩා ඉවත් කළ යුතු වූ අතර, ඌරු තෙල් සහ ගව තෙල් ආලේප කොට තිබූ බවට කට කතා පැතිර තිබිණි. හින්දූන්ට ගවතෙල් ද මුස්ලිම්වරුන්ට ඌරුතෙල් ද කට ගෑම ආගමික වශයෙන් තහනම් වූ බැවින් එම පතරොම් භාවිතය සොල්දාදුවන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එහෙත් ඒවා පාවිච්චි කරන ලෙස බලකිරීම හේතුවෙන් සොල්දාදුවෝ කැරලි ගැසූහ.

ක්‍රි.ව. 1857 මැයි 10 දා ආරම්භ කළ මෙම කැරැල්ල ඉතා දරුණු ලෙස මර්දනය කළ අතර ඊට මාස 15 ක පමණ කාලයක් ගත විය. කැරැල්ල අසාර්ථක වීමට බලපෑ සාධක කිහිපයකි.

- සැලැස්මක් නොමැතිකම
- සාමාන්‍ය ජනතාවගේ සහාය නොලැබීම
- මනා නායකත්වයක් නොතිබීම
- ධනය හා සේනා බලය හිමි ප්‍රභුවරුන් මේ කැරැල්ලට සහාය නොදීම
- පොදු අරමුණක් නොතිබීම
- බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ උපක්‍රමශීලී ක්‍රියාමාර්ග

ක්‍රි.ව. 1857 කැරැල්ලේ වැදගත් ම ප්‍රතිඵලය වූයේ බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගමේ පාලනය අවසන් කොට ඉන්දියාව බ්‍රිතාන්‍ය කිරීටය යටතට පත් කිරීම යි. මෙය සිදු කරන ලද්දේ ක්‍රි.ව. 1858 අගෝස්තු 02 දින සම්මත කරගත් ඉන්දියානු ආණ්ඩු පනත මඟිනි. බ්‍රිතාන්‍ය ඉතිහාසඥයන් විසින් උපහාසයෙන් යුතුව හඳුන්වනු ලබන ක්‍රි.ව. 1857 සිපොයි කැරැල්ල ඉන්දියාව සලකන්නේ නිදහස පතා ගෙන ගිය අරගලයේ වැදගත් සන්ධිස්ථානයක් වශයෙනි. ඉන්දියානු ජනතාවගේ සිත් තුළ නිදහස ලබා ගැනීමේ අභිලාෂය වර්ධනය වූයේ මේ කැරැල්ලෙන් පසුව ය. දේශාභිමානී හැඟීම් වර්ධනය වන විට ඉන්දියානුවෝ විවිධ ප්‍රදේශවල සන්නද්ධ අරගල ගෙන ගියහ.

ක්‍රි.ව. 1857 කැරැල්ල අසාර්ථක වීමෙන් ඉන්දියානු නිදහස් සටනේ පුරෝගාමීන් වටහා ගත් කරුණක් වූයේ සාකච්ඡා කිරීම හා තර්ක කිරීම මඟින් ඉන්දියානු ජනතාවගේ අවශ්‍යතා බ්‍රිතාන්‍ය පාලකයන්ට වටහා දී තම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා සංවිධාන පිහිටුවීම යෝග්‍ය බවයි. ඒ අනුව ක්‍රමානුකූලව සංවිධානය වූ ජාතික ව්‍යාපාරයක් නැඟී ඒම ආරම්භ විය. ඉන්දියානුවන් තුළ ජාතිකානුරාගය වර්ධනය කිරීමට බ්‍රිතාන්‍යයන් ඉන්දියාව සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති හේතු විය.

| | | |
|---|---|---|
| ⏩ කෘෂිකර්මය | : | අධික ඉඩම් බදු පැනවීමෙන් දේශීය කෘෂිකර්මය නොවටිනා තත්ත්වයකට පත් විය. මේ බදු හේතු කොට ගොවීන් කොතරම් පීඩනයකට ලක් වී දැයි කිවහොත් ඔවුහු ගොවිතැන් නොකර ඉඩම් අත්හැර දමන තත්ත්වයකට පත් වූහ. එසේ කළහොත් බඩගින්නේ මිය යාමට සිදු වෙයි. වගා කළහොත් මුළු අස්වැන්න බදු වශයෙන් ගෙවිය යුතු වේ. මෙම තත්ත්වය යටතේ ජනතාව උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ දුන් අතර ඔවුන් අසරණ තත්ත්වයට පත්ව සිටිය දී ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථික ක්‍රමය බිඳ වැටිණි. |
| ⏩ කර්මාන්ත | : | බ්‍රිතාන්‍යයෝ ඉන්දියාවේ සම්පත් තම රටට ගෙන ගිය අතර තේ සහ කෝපි වගාකිරීමේ කර්මාන්ත සඳහා ඉංග්‍රීසි ධනපති පංතිය උනන්දු කළ හ. ඉතා අඩු වැටුපකට කම්කරුවන් ලෙස ඉන්දියානුවන් යොදා ගත්හ. කම්කරු ශ්‍රමය නිර්දය අන්දමින් සූරා කනු ලැබිණි. |

- **සාගත** : ඉන්දියාවේ වරින්වර ඇති වූ සාගත නිසා ඉන්දියානුවෝ ලක්ෂ ගණනින් මිය ගියහ. සාගතවලින් ජනතාව මුදා ගන්නට කිසිදු සැලකිල්ලක් නො දැක්වී ය. කළුකඩ වෙළෙන්දෝ අධික මිලකට ආහාර ද්‍රව්‍ය අලෙවි කළහ. ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීමට නොහැකි වූ අය හාමතේ මිය ගියහ. වරෙක බෙංගාලයේ ඇති වූ සාගතයකින් ලක්ෂ 35 කට අධික ජනතාවක් මරණයට පත් වූ බව කියැවේ.
- **බටහිර අධ්‍යාපන ක්‍රමය** : බ්‍රිතාන්‍යයන් විසින් බටහිර අධ්‍යාපන ක්‍රමය ව්‍යාප්ත කරන ලද්දේ ඔවුන්ගේ පරිපාලන, දේශපාලන හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකර ගැනීමට ය. එසේ වුවත් බටහිර අධ්‍යාපන ක්‍රමය ව්‍යාප්ත වන විට අනපේක්ෂිත ප්‍රතිඵල උදා වන්නට විය. ඉංග්‍රීසි අධ්‍යාපනය නිසා යුරෝපා රටවල පැවති ජාතිකානුරාගී ව්‍යාපාර පිළිබඳ මනා අවබෝධයක් ඉන්දියානුවෝ ලබා ගත්හ. ප්‍රංශ විප්ලවයේ සටන් පාඨය වූ නිදහස සමානාත්මතාව හා සහෝදරත්වය ඉන්දියානුවන්ගේ සිත් ගත්තේ ය. රූසෝ, තෝමස් පේන්, වෝල්ටෙයාර්, මොන්ටෙස්ක්‍යු, ගැරිබෝල්ඩි වැනි ලිබරල්වාදී දේශපාලන චින්තකයන්ගේ අදහස් ඉන්දියානු සමාජය ප්‍රබෝධයට පත් කෙළේ ය.

ඉංග්‍රීසීන් ක්‍රි.ව. 1649 දී තම රජු වූ පළමු වන චාර්ල්ස් රජුගේ හිස ගසා දැම්මේ ඔහු කෲර ආඥාදායකයකු වූ බැවිනි. දෙවන ජේම්ස් රජු එම තනතුරට යෝග්‍ය නොවන බැවින් ක්‍රි.ව. 1688 දී ඔහු නෙරපා දැමිණි. රජවරුන්ගේ හිස් ගසා දැමීමට හා රජවරුන් සිහසුනෙන් නෙරපා දැමීමට ඉංග්‍රීසීන්ට අයිතියක් තිබේ නම් තමන්ට ද එම අයිතිය ඇතැයි ඉන්දියානුවෝ සිතූහ.

විවිධ භාෂා කථා කරන ඉන්දියානුවන් අතර සමීප සබඳතා ඇති කිරීමට ඉංග්‍රීසි අධ්‍යාපනය මහත් සේ උපකාරී විය. ඉංග්‍රීසි භාෂාව අදහස් හුවමාරු කර ගැනීමේ සම්බන්ධීකරණ භාෂාව විය.

ඉන්දියාව එක්සත් කරන ලද්දේ බ්‍රිතාන්‍යයන් විසින් පිහිටුවනු ලැබූ සංකේන්ද්‍ර ගත ඒකාබද්ධ පාලනය සහ මංමාවත්, දුම්රිය, විදුලි බලය ආදී කටයුතු මඟිනි. මේ ඒකාබද්ධතාව ඉන්දියානුවන් එකම ජාතියක් සේ සිතීමට බලපෑ එක් සාධකයකි. බ්‍රිතාන්‍යයන්ගේ උද්ධච්චභාවය, ඉන්දියානුවන් කොන් කිරීම, නීතිය ඉදිරියේ ඉන්දියානුවන් සමාන නොවීම යන කරුණු ද බ්‍රිතාන්‍ය පාලනය අප්‍රසන්න වීමට හේතු වී ය.

බ්‍රිතාන්‍යයන් විසින් දුම්රිය මාර්ග, මහාමාර්ග හා තැපැල් සේවය වැනි යටිතල පහසුකම් සපයන ලද්දේ භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා ය. එහෙත් මේ පද්ධතිය ඔස්සේ ජාතිකානුරාගී අදහස් පැතිර යාම ඉතා වේගයෙන් සිදු වීම බ්‍රිතාන්‍යයන් අපේක්ෂා නොකළ ප්‍රතිඵලයක් විය.

බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියානුවන් සලකන ලද්දේ කිසිදු සංස්කෘතියක් නැති පිරිසක් ලෙස යි. මේ නිසා ඉන්දියානුවන්ගේ ආත්ම විශ්වාසය හීන වී තිබිණි. නමුත් ශ්‍රීමත් ජෝන් මාර්ෂල්, විලියම් ජෝන්ස්,මැක්ස්මුලර්, මෝටිමර් විලර් යන විද්වතුන් විසින් හරප්පා සභ්‍යත්වයේ සිට ඉන්දියාවේ අතීතය නිරාවරණය කිරීම, ඉන්දියානුවන් තුළ තම අතීතය පිළිබඳව මහත් ප්‍රබෝධයක් ඇති කිරීමට හේතු විය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

- ඉන්දියාවේ ව්‍යවහාර වන භාෂා ලැයිස්තුගත කරන්න.
- ඉන්දියාවේ ප්‍රාන්ත දැක්වෙන සිතියමක් සකස් කරන්න.

දැන් ඔබට ඉන්දියාවේ ජාතිකානුරාගය වර්ධනය වීමට බල පෑ ඓතිහාසික පසුබිම පිළිබඳ අවබෝධයක් ලැබෙන්නට ඇතැයි සිතමු. ඊ ළඟට අප යොමු වන්නේ ඉන්දියාවේ ජාතික නිදහස උදෙසා සටන් කළ සංවිධාන හා ජන නායකයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට ය.

19 වැනි සියවසේ දෙවන භාගයේ දී නිදහස ලබා ගැනීමේ අරමුණෙන් විවිධ දේශපාලන සංවිධාන බිහි වූ අතර ඉන් වැදගත් ම සංවිධානය වන්නේ ක්‍රි.ව. 1876 දී සුරේන්ද්‍ර නාත් බැනර්ජි විසින් පිහිටුවන ලද කල්කටාවේ ඉන්දියානු සංවිධානය යි. බ්‍රිතාන්‍යයන් කෙරෙහි තිබූ අප්‍රසාදය මුලින් ම ප්‍රසිද්ධියේ කියා පෑවේ මේ සංවිධානය යි. බැනර්ජි මහතා රටපුරා ගමන් කරමින් ජනතාවට තම සංවිධානයේ අරමුණු පැහැදිලි කෙළේ ය. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම් තුනකි.


- සිවිල් සේවා විභාගය ප්‍රතිසංවිධානය කිරීම
- අවි ආයුධ පනත සංශෝධනය කිරීම
- බ්‍රිතාන්‍ය වැවිලිකරුවන්ගෙන් ගොවීන් ආරක්ෂා කිරීම

සුරේන්ද්‍ර නාත් බැනර්ජිගේ සංචාරයේ දී ලැබූ මහජන ප්‍රතිචාර ඉතා ඉහළ මට්ටමක තිබුණ බැවින් සමස්ත ඉන්දියානු ජාතික සමුළුවක් පැවැත්වීමේ වැදගත්කම පැහැදිලි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විශ්‍රාමලත් බ්‍රිතාන්‍ය සිවිල් සේවකයකු වන ඇලන් ඔක්ටේවියන් හියුම් විසින් "ඉන්දියානු ජාතික එකමුතුව" ආරම්භ කරන ලදී. මේ සමුළුවට ඉන්දියාවේ සෑම ප්‍රදේශයකින් ම පාහේ නියෝජිතයෝ පැමිණියහ. බැනර්ජි මහතා

විසින් මේ සමුළුවේ දී සංවිධානයේ නම "ඉන්දියානු ජාතික කොන්ග්‍රසය" යනුවෙන් වෙනස් කරන ලදී. ඉන්දියානු ජාතික කොන්ග්‍රසය ගුරුවරුන්, වෛද්‍යවරුන් ඉංජිනේරුවරුන්, නීතිඥයන්, මහාචාර්යවරුන් වැනි විද්වතුන්ගෙන් සමන්විත වූ නමුත් පොදු ජනතා නියෝජනයක් නොවී ය.

ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ මූලික අරමුණු කිහිපයකි. එහි ප්‍රථම සභාපතිවරයා වූයේ ඩබ්ලිව්. සී. බැනර්ජි මහතා ය.

- ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල ජීවත් වන ජනතාව තුළ දේශාභිමානය ඇති කිරීම
- රටේ මහජන මතය සංවිධානය කිරීම
- කුලය, ආගම හෝ ප්‍රදේශය ගැන නොසලකා ජාතික හැඟීම් වර්ධනය කිරීම
- පොදු ජාතික ඉල්ලීම් බ්‍රිතාන්‍ය පාලකයන් වෙත ඉදිරිපත් කිරීම



රූපය 3.3
ඩබ්ලිව්. සී. බැනර්ජි මහතා

ඉන්දියානු ජාතික කොන්ග්‍රසය විසින් වාර්ෂිකව රටපුරා ප්‍රධාන නගරවල සමුළු පවත්වන ලදී. ඔවුහු රජය වෙත ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කළහ.

- අධ්‍යාපනය සඳහා වැඩි පහසුකම් සැලසීම
- යුධ වියදම් අඩු කිරීම
- ආයුධ ගෙන යාමේ අවසරය
- සිවිල් සේවා විභාගය මහා බ්‍රිතාන්‍යයේ හා ඉන්දියාවේ එකවර පැවැත්වීම
- ඉහළ තනතුරුවලට ඉන්දියානුවන් වැඩි පිරිසක් බඳවා ගැනීම

ඉන්දියානු ජාතික කොන්ග්‍රසයට ආවේණික දෝෂය වූයේ දැඩිමතදරි හා මධ්‍යස්ථවාදි දෙපිරිස ම එහි සිටීම ය. ප්‍රථමයෙන් ම කොන්ග්‍රසයේ බලය අත්පත් කොට ගත්තේ මධ්‍යස්ථ මතධාරී කණ්ඩායම යි. සාකච්ඡා, තර්ක කිරීම් හා පෙත්සම් මඟින් තම ඉල්ලීම් දිනා ගත හැකි බව ඔවුහු විශ්වාස කළහ. මෙම මධ්‍යස්ථ මතධාරීහු බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ සිටීම ආශිර්වාදයක් සේ සැලකූහ. සති පූජාව, ළදරු විවාහ හා කුල භේදය තහනම් කිරීමෙන් ඉන්දියාවට විශාල යහපතක් සිදු වූ බව මධ්‍යස්ථ මතධාරීහු විශ්වාස කළහ. බ්‍රිතාන්‍යයන් හා කොන්ග්‍රසය අතර මිත්‍රශීලී සබඳතාවන් පැවති අතර ඇතැම් විට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කොන්ග්‍රසයේ රැස්වීම්වලට සහභාගි වූහ. එසේ වුව ද ජාතික කොන්ග්‍රසයේ ඇතැම් නායකයන් බ්‍රිතාන්‍ය පාලනය ප්‍රසිද්ධියේ විවේචනය කරන විට බ්‍රිතාන්‍ය පාලකයෝ ජාතික කොන්ග්‍රසය සමඟ විරසක වූහ. ඉන්පසු බ්‍රිතාන්‍ය පාලකයන් කෙළේ ජාතික කොන්ග්‍රසය අවඥාවට ලක් කොට ඊට එරෙහිව වෙනත් ව්‍යාපාර සංවිධානය කිරීම යි.

ඉන්දියානු කොන්ග්‍රසය තුළ පොදු ජනතාව නියෝජනය නොවූ බැවින් එහි නායකයන් හා ජනතාව අතර දුරස්ථ බවක් ඇති විය.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

- ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ අරමුණු වගුගත කරන්න.

කොන්ග්‍රසයේ සිටි දැඩිමතදරින්ගෙන් මධ්‍යස්ථ මතධාරීන් වෙත බොහෝ විවේචන එල්ල විය. එසේ වුවද මධ්‍යස්ථ මතධාරීහු සැලකිය යුතු ජයග්‍රහණයක් අත් කර ගත්හ. ඔවුහු බ්‍රිතාන්‍යන්ගේ අන්ධ අනුගාමිකයෝ නො වූහ. ඔවුන්ගේ ඉවසීම දුර්වලකමක් නොවී ය. පසුකලෙක වර්ධනය වන ඉන්දියානු ජාතිකානුරාගයේ මුල් බීජ ප්‍රජාතන්ත්‍රවාදය හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ඇති කරන ලද්දේ ඔවුන් විසිනි.

ඊ ළඟට අපි ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ මධ්‍යස්ථ මතධාරී නායකයන් කිහිප දෙනෙකු හඳුනා ගනිමු.

## දඩාභායි නඕරෝජි

"ඉන්දියාවේ සම්භාවනීය මහල්ලා" යනුවෙන් හඳුන්වනු ලබන මොහු ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ මුල්ම සමාජිකයෙකි. හේ බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියාවේ කරනු ලබන සූරාකෑම් හා අසාධාරණකම් පිළිබඳව බ්‍රිතාන්‍ය පාලකයන් දැනුවත් කිරීම සඳහා බොහෝ කාලයක් එංගලන්තයේ වාසය කෙළේ ය. බ්‍රිතාන්‍ය ලිබරල් පක්ෂයේ සාමාජිකයකු වූ මොහු මන්ත්‍රීවරයකු ලෙස බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට තේරී පත් විය. එහිදී ද ඉන්දියානුවන් වෙනුවෙන් තම සටන ගෙන ගියේ ය.



රූපය 3.4
දඩාභායි නඕරෝජි
මහතා

## ගෝපාල් ක්‍රිෂ්ණ ගෝඛලේ

ගෝඛලේ ක්‍රි.ව. 1856 දී මහාරාෂ්ට්‍රයේ ඉපිද ගුරුවරයකු වශයෙන් සේවය කළ අයෙකි. පසුව ෆර්ගසන් විදුහලේ අධිපති බවට පත් වූ ඔහු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාගේ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සාමාජිකයකු ද වී ය. ඔහු එහිදී ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කිරීම සඳහා පනතක් ඉදිරිපත් කළ නමුත් එය සාර්ථක නොවී ය.



රූපය 3.5
ගෝපාල් ක්‍රිෂ්ණ ගෝඛලේ
මහතා

## සුරේන්ද්‍ර නාත් බැනර්ජි

මොහු ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ පියා ලෙස සලකනු ලබයි. "බෙංගාලි" නැමති පුවත්පතේ කතුවරයා වූ මොහු රිපන් විදුහල ආරම්භ කළ පුද්ගලයා වෙයි. ඔහු ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ සභාපතිවරයා ලෙස දෙවරක් ම තේරී පත් විය.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම

**ඉන්දියානු ජාතික කොන්ග්‍රසයට සම්බන්ධ වූ තවත් පුද්ගලයන් සොයා ඔවුන්ගේ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.**

ඉන්දීය ජාතික කොන්ග්‍රසයේ මධ්‍යස්ථ මතධාරීන් ගේ ඉල්ලීම් දිනාගැනීම අසාර්ථක වන විට, සටන්කාමී නායකයන් බිහි වීම දක්නට ලැබේ. සටන්කාමී නායකයෝ ජයග්‍රහණ කිහිපයක් අත්කර ගත්හ. ඒවායින් කිහිපයක් පහත දැක්වේ.

- නිදහස් සටන් ව්‍යාපාරයට පොදු ජන පදනමක් දැමීම
- උගතුන්, ගොවියන්, කම්කරුවන් වැනි පිරිස් නිදහස් සටන් ව්‍යාපාරයට එකතු කර ගැනීම
- ඩොමීනියන් තත්ත්වයේ නිදහස නොව පූර්ණ නිදහස සඳහා අරගල කිරීම
- විදේශීය භාණ්ඩ පරිහරණය ප්‍රතික්ෂේප කිරීම
- වැඩවර්ජනවලින් බ්‍රිතාන්‍ය ආර්ථිකය දුර්වල කිරීම
- පුවත්පත් මඟින් ජාතිකානුරාගය ඇති කිරීම

පහත දැක්වෙන්නේ ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ සටන්කාමී නායකයින් අතුරින් කිහිප දෙනෙකි.

## බාල් ගංගාධාර් තිලක් (1856-1920)

මහාරාෂ්ට්‍රයේ උපත ලැබූ මොහු වෘත්තියෙන් නීතිඥයෙකි. ඉන්දියාවේ විශාල විපර්යාසයක් ඇති කිරීමට නම් අධ්‍යාපනය අත්‍යවශ්‍ය මාධ්‍යයක් බව විශ්වාස කෙළේ ය. ''කේශරි'' සහ ''මරාඨ'' යන පුවත්පත් ආරම්භ කෙළේය. "ලෝක මාන්‍ය" යන විරුදයෙන් ද ඔහු හැඳින්විණි.

## බිපින් චන්ද්‍රපෝල් (1858-1932)

මොහු ක්‍රි.ව. 1858 ඇසෑමයේ උපත ලැබී ය. 1887 දී ඉන්දියානු ජාතික කොන්ග්‍රසයට බැඳුණු ඔහු ඉන්දියාවට පූර්ණ නිදහස ලබා ගැනීමට තම සංවිධානය සටන් කළ යුතු බව අවධාරණය කෙළේ ය.

## ලලා ලජ්පත් රායි (1865-1928)

ක්‍රි.ව. 1865 දී පන්ජාබයේ උපත ලද ලලා ලජ්පත් රායි වෘත්තියෙන් නීතිඥයෙකි. ක්‍රි.ව. 1888 දී ජාතික කොන්ග්‍රසය බ්‍රිතාන්‍ය රජයට පෙත්සම් ලිවීම නිෂ්ඵල ක්‍රියාවක් බව විශ්වාස කළ ඔහු බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව නැඟී සිටිය යුතු බව පෙන්වා දුන්නේ ය.



රූපය 3.5 - i
ලලා ලජ්පත් රායි මහතා